(71)

පරිපාලන චක්‍රලේඛ අංක : 2021/CL/48

මගේ අංක : RDA/A/AA2/MCL/GEN
මාර්ග සංවර්ධන අධිකාරිය,
මගනැගුම මහ මැදුර,
බත්තරමුල්ල.

2021.05.19

සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියලුම අධ්‍යක්ෂවරුන්
සියලුම අතිරේක අධ්‍යක්ෂවරුන්
සියලුම පළාත්භාර අධ්‍යක්ෂවරුන්
සියලුම ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්
සියලුම ප්‍රධාන ඉංජිනේරුවරුන්
සියලුම විධායක ඉංජිනේරුවරුන්
දිසා යාන්ත්‍රික ඉංජිනේරු (අගුලාන)
යාන්ත්‍රික ඉංජිනේරු (පෙරමුසු අංගනය)
ප්‍රධාන ගබඩා සම්බන්ධතා නිළධාරි (මරදාන)
වැඩ අධිකාරි (ප්‍රවාහන)

<u>**යතුරුපැදි ණය නිකුත් කිරීම.**</u>

යතුරුපැදි ණය නිකුත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2005.03.16 දිනැති අංක 2005/07 දරණ පරිපාලන චක්‍රලේඛය හා 2012.07.30 දිනැති අංක 2012/10 දරණ පරිපාලන චක්‍රලේඛය හා බැඳේ.

ඒ අනුව මෙම අධිකාරියේ රියදුරු සේවයේ, කණිෂ්ඨ සේවයේ සහ මුරකරු සේවයේ නියුතු සේවකයින්ටද යතුරුපැදි මිලදීගැනීම සඳහා රු: 150,000.00 ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලබා දීමට තීරණය කර ඇති බව සතුටින් දන්වමි.

මෙම ණය මුදල මාසික වාරික 60 කින් 4.2%ක පොළියක්ද සමග ආපසු අයකර ගැනීමට කටයුතු කෙරේ. ණය මුදල ආපසු අයකර ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 60 ක් වේ.

**ණය නිකුත් කිරීමේ කොන්දේසි**

**සුදුසුකම්:**

01. අධිකාරියේ සේවයේ නියුතු වසර 03 ක පරිවාස කාලය අවසන් කර තනතුරේ ස්ථිර කර තිබීම.

**ණය ලබාගැනීමේ හිමිකම් නොලබන අය**

i ණය ඉල්ලුම්කරු / ඉල්ලුම්කාරිය විනය පරීක්ෂණයකට යටත්ව සිටිනා අවස්ථාවකදී

ii පරිවාස කාලය අවසන් කර තනතුරේ ස්ථිර කර නොතිබීම.

iii මාසික වැටුපෙන් අඩු කරන සෙසු අඩුකිරීම් වලින් පසු වැටුප් සීමාව 40% ඉක්මවා යන අවස්ථාවකදී

ණය ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය සමග පහත සඳහන් ලේඛන ඉදිරිපත් කල යුතුය.

1. ණය ඉල්ලුම්පත්‍රය සමග ගණකාධිකාරී වැටුප් සහතික කරන ලද ආසන්න මාසයේ වැටුප් ලේඛණය.

2. ඉල්ලුම්කරුට සමාන හෝ උසස් තනතුරක පරිවාස කාලය අවසන් කර තනතුරේ ස්ථිර කරන ලද අධිකාරියේ සේවකයකුගේ ඇප ප්‍රකාශය සමග ගණකාධිකාරී වැටුප් විසින් සහතික කරන ලද වැටුප් ලේඛනය. එක් සේවකයකුට ඇපකරුවකු ලෙස ඉදිරිපත් විය හැක්කේ අධිකාරියේ ක්‍රියාත්මක ණය මුදල් 2 ක් සඳහා පමණි. ඊට අමතරව ණය ඉල්ලුම්කරුට සමාන සුදුසුකම් ඇපකරුට තිබිය යුතුය.

3. යතුරුපැදියේ මිල දැක්වෙන වෙළඳ ආයතනයෙන් ලබාගත් මිල ගණන් ලේඛණය

4. පාවිච්චි කරන ලද යතුරුපැදියක් නම් වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගෙන් ලබාගත් තක්සේරු වාර්ථාව සමග යතුරුපැදියේ ලියාපදිංචි සහතිකයේ පිටපත.

සියලුම අයදුම්පත් අංශ ප්‍රධානියාගේ නිර්දේශය සහිතව පාලන අංශය වෙත යොමු කල යුතුය. අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව ණය නිකුත් කරනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් භාර ගනු නොලැබෙන අතර ගිවිසුම් හා ඇප බැදුම්කර පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.

මෙම චක්‍රලේඛය ඔබ අංශයේ / කාර්යාලයේ සියලුම නිලධාරීන් / සේවකයින් ගේ දැන ගැනීම සඳහා යොමු කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**මාර්ග සංවර්ධන අධිකාරිය.**

පිටපත් : විගණකාධිපති

ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය

සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය

ක්‍රියාකාරී අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය